ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මඩකළපුව

## ජාතික තරඟකාරී ලංසුකරණය

# ලංසු දැන්වීමයි

01. මඩකලපුව, දිස්ත්‍රික් ලේකම් වෙනුවෙන් දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත විස්තරකොට ඇති භාණ්ඩ, සේවාව සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

02. මෙම ලංසු කැඳවීම ජාතික තරඟකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය මගින් මෙහෙයවනු ලැබේ.

03. සුදුසුකම්ලත් ලංසුකරුවන් ශ්‍රී ලංකාවේ ව්‍යාපාර ලියාපදිංචිය ලබා තිබිය යුතු අතර අසාදු ලේඛනගත නොවූ ලංසුකරුවන් සඳහා සීමා කොට ඇත.

04. යෝග්‍යතා පිළිබඳ විස්තර ලංසු ලිපිලේඛනයේ ඇතුළත් කොට ඇත.

05. අභිලාෂී යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් වැඩිදුර තොරතුර මඩකලපුව, තිරායිමඩු, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් ලේකම් වෙතින් (දුරකථනය : 065-2222233, ෆැක්ස් : 065-2224466) ලබාගත හැකි අතර, පහත සඳහන් ලිපිනයේදී ඕනෑම රාජකාරී දිනයකදී පෙ.ව. 9.00 හා ප.ව. 4.00 අතර ප්‍රසම්පාදන ලිපිලේඛන පරීක්ෂාකර බැලිය හැකිය.

06. එක ලිපිලේඛන කට්ටලයක් සඳහා පහත වගුවේ සඳහන් ආපසු ගෙවනු නොලබන ගාස්තුව ගෙවීමෙන් අනතුරුව 2026.10.16 වෙනි දින සිට 2026.10.29 වෙනි දින දක්වා ඕනෑම රාජකාරී දිනයක පෙ.ව. 9.00 සහ ප.ව. 3.00 අතර මඩකලපුව, තිරායිමඩු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් ලේකම් වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් ආපසු නොගෙවන ගාස්තුව මුදලින් ගෙවා මිලදී ගත හැකිය.

07. ලංසු, 2026.10.30 වෙනි දින ප.ව. 3.00 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි සභාපති, දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, තිරායිමඩු, මඩකලපුව යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවීමට හෝ මඩකලපුව, තිරායිමඩු, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හැකිය. ප්‍රසම්පාදනයේ විස්තරය ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලංසු භාරගැනීම අවසන් වූ වහාම පහත සඳහන් ලිපිනයේදී එම අවස්ථාවට පුද්ගලිකව පැමිණ සිටීමට කැමැත්තක් දක්වනු ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

08. සියලුම ලංසු සමග පහත වගුවේ ලබා දී ඇති තොරතුර ප්‍රකාර වූ බැංකු සුරක්ෂණයක හෝ ආපසු ගෙවන මුදල් තැන්පතුවක ආකාරයේ ලංසු ඇපකරයක් අමුණා එවිය යුතුය. මුදල් තැන්පතුවක් නම්, එම මුදල මඩකලපුව, තිරායිමඩු, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තැන්පත් කොට ලබාගත් මුදල් තැන්පතු ලදුපතේ මුල් පිටපත ලංසුව සමග අමුණා ඉදිරිපත් කළ යුතුය.

09. ලංසු, මුල් පිටපත හා අනු පිටපත ලෙස පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුය. මුල් පිටපත හා අනු පිටපත වෙන් වෙන් වශයෙන් මුද්‍රා තබන ලද කවරවල බහා "මුල් පිටපත" හා "අනු පිටපත" ලෙස ලකුණු කළ යුතුය. ඉන් පසුව කවර දෙකම මුද්‍රා තබන ලද තනි කවරයක බහා එහි වම ඉහළ කෙළවරේ කර්මාන්තයේ විස්තරය හා ලංසු අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

10. ලංසු, 2027-01-15 වෙනි දින දක්වා වලංගු විය යුතුය.

11. පූර්ව ලංසු රැස්වීම, 2026.10.21 වෙනි දින පෙ.ව. 10.30 ට ආරම්භව මඩකලපුව, තිරායිමඩු, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පැවැත්වේ. අභිලාෂී ලංසුකරුවන් ඔවුන්ගේ වියදමින් මෙම රැස්වීමට සහභාගි විය හැකිය.

12. කොන්ත්‍රාත් ප්‍රදානයට පෙර ඕනෑම අවස්ථාවක මෙම ප්‍රසම්පාදනය අවලංගු කිරීමේ හෝ ඉල්ලා අස්කර ගැනීමේ අයිතිය සේවා යෝජක සතුය.

| ප්‍රසම්පාදන විස්තරය සහ ලංසු අංකය | සෘජු පිරිවැය (බදු හැර) (රු.) | 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ අවශ්‍යතාවය | ලංසු ඇපකරයේ විස්තරය | | ආපසු නොගෙවන ගාස්තුව (රු.) | කොන්ත්‍රාත් කාලය | මුදල් ප්‍රභවය |
|---|---|---|---|---|---|---|---|
| | | | ලංසු ඇපකරයේ වටිනාකම | වලංගු කාලය | | | |
| වී වියලන යන්ත්‍රය සහ උපාංග සපයා සවි කිරීම (විස්තර ලංසු ලේඛනයේ ලබාදී ඇත - නැවත ලංසු කැඳවීමක් PMD/SPDNI/2/2026/540 | 20,338,983.06 | ඔව් | 204,000.00 | 2027.02.12 | 5,000.00 | දින 45 යි | රජයේ අරමුදල් |
| මධ්‍යම ප්‍රමාණයේ අයිස් කැට නිෂ්පාදන යන්ත්‍රාගාරයක් ඉදිකිරීම PMD/ICE-Fac.Pla/Do-4/2026 | 11,016,949.15 | ඔව් | 130,000.00 | 2027.02.12 | 4,000.00 | දින 45 යි | රජයේ අරමුදල් |

ජේ. එස්. අරුල්රාජ්,
සභාපති, දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුව,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, තිරායිමඩු, මඩකළපුව.
2026-10-15


